# පහන් වැට



## වෙසක් සිතුවිලි

රසික සූරියආරච්චි

බසින් පාලි අපි පන්සිල් පද කියමු
සිතින් එහි අරුත කිසිවිට නොම සිතමු
කයෙන් සිතෙන් දස අකුසලකම් කරමු
පවෙන් ගැලවෙන්න තව බොරුවේ ගැළෙමු

ගව ඝාතනය මහ පාපෙකි ලොව තිබෙන
එම කාරණය ඇසු සැන අප නෙත් තෙමිණ
යුද භීෂණය මැද හොර රහසෙම කෙරුණ
ජන ඝාතනය දැන ඉමු මුවගින් නොබැණ

උත්තමයෝ අපිය නැත කළ කිසි වරද
සත්තම දමන්නට එන්නේ කොයි කවුද
ඇත්තම වීඩියෝවල සටහන් වුවද
ගෙත්තම කර මුසා වහගන්නෙමු එයද

අතින් රැගෙන බොදු ධජ හැර කුළුණු මෙත
බලන් පල්ලි කැඩුමට යන පිරිස මිත
ඇසින් දුටුවොතින් ජඩ වැඩ දඹුළු පෙත
බුදුන් පාරලෙයි වනයට වඩිනු ඇත

පොරවා කහ පැහැති දිදුලන බැටළු හම
පුරවා සිතේ ක්‍රෝධය අමනුස්සකම
සගවා කැත ජාතිවාදය ඇතුල ළැම
මරුවා ලෙසින් කරතිය වැදි බණ දෙසුම

ගුවන් විදුලියේ හැම දිනයකම බණ
නුවන් පිනයි බණ රූ-වාහිනියෙ එන
මෙවන් පිනට බර දේසෙක හතර කොන
රජුන් කොසොල් දුටු සිහිනය සැබෑවිණ

ගතේ දැවටුනද බණ පද නිරන්තර
අතේ පිරිත් ලණු බැඳුණද වරින්වර
සිතේ පිරී ඇති තුරු මෝහය අඳුර
මෙතේ බුදුන් වඩිනා දින තවත් දුර

## මවකගෙ කඳුළු

නෙතු පියන් යට
කඳුළු හංගා
නුඹ සිනා සෙනවා

දුවා දරුවන්
ඒ සිනාවෙන්
සතුට උකහනවා

හුදකලා වුනු
කඳුළු ඉකිබිඳ
ඉබේ වියැලෙනවා

මව් ගුණෝ පෙර දැරිව
නුඹ
හැමදේම ඉවසනවා

මාලා කරුණාතිලක
කුරුණෑගල

## වෙන්ව ගිය ඇයට

මොහොතක් නැතිව මා අසලම පෙර    දවස
නිරතුරු සෙනහසින් සැනසුව වෙමි    පවස
ඈතක ඔබ මගෙන් වෙන් වී ගිය    දවස
පාලුයි ඔබ නැතිව සොඳුරිය මගෙ    නිවස

ගස සරු උනත් පල කිම නැතිනම්    ඵලය
සයුරෙහි රළ නැගේවිද නැතිනම්    ජලය
දුක සැප පොදු දෙයකි තුල මේ මිහි    තලය
බින්දට පසු තැවෙනු කිම දිය ඇදි    කළය

පෙර සසරෙදිත් අපි එකතුව ඉන්න    ඇති
පෙම් රැහැණින් බැඳී දිවි රස බොන්න    ඇති
සසරෙහි දුක සනිටු කර වෙන් වෙන්න    ඇති
මේ භවයෙදිත් ඒ පව පල දෙන්න    ඇති

ආ මඟ දුරයි බැලුවෙමි ආපසු    හැරිලා
කෙළවර පෙනෙන තරමට ඈත    ළංවීලා
නොදැනිම ඒ දුරත් හෙමිහිට යයි    ගෙවිලා
නුඹ ගැන මතක ඇත හද පතුලෙහි    කිඳිලා

රූපය දිරන මුත් නාමය    නොදිරන්නේ
කල හොඳ නරක දෙක පමණකි    ගෙනියන්නේ
නුඹ ගැන කිසිවිටක අහිතක්    නොසිතන්නේ
ඉරණම මෙසේ නම් කෙලෙසද    වලකන්නේ

ජය, සැප, සතුට ආශාවන් පැතුම්    පොදී
බැඳ ඇත තන්හාව හිත තුලට කා    වැදී
අන්ධව ඒ බරින් මිනිසා ගැහැට    විඳී
කිසි දින සිටිය හැකිවෙද මරණයෙන්    මිදී

සරත් වීරසේකර - ටොරොන්ටෝ - කැනඩාව

## පාපකර්ම

පාන්දරම හෝටලේට දුවන්නියේ
කාමර කිලි කුණු ශෝධන කරන්නියේ
සේද පුළුන් ඇඳ ඇතිරිලි එලන්නියේ
සීත පොළොවෙ දරුවා නිදි කරන්නියේ

කෑම වලට රාජ බොජුන් උයන්නියේ
මේස වල තබා හැඩවැඩ බලන්නියේ
ලාභ බඩු හොයන් කඩවල දුවන්නියේ
වීසි කරන එළවලු ගෙන තැවෙන්නියේ

මාලිගාව සේ සුවිසල් හෝටලයේ
පේන කුලී ගෙදර වැටී නිදන්නියේ
හීන බලන ගමන් සිනා සලන්නියේ
පාප කර්ම වලට කුමක් කරන්නියේ

අතුල විජේවික්‍රම



## මරියා

මාලතී කල්පනා ඇම්බ්‍රෝස්

ඇගේ නම මරියා
හැම කඳුළු කවුළුව ම ඇරියා
උතුරුකුරු තරු ලකුණ විමසා
උතුරු අහසට සිතින් නැගුණා

හමුවුණා නම් ඔබට,
ඈ නමින් මරියා...

හද විසල් බව දරණු බැරි වී
සොවින් කෘෂ වූ සිරුර වැහැරී
ඇහුවේ ම නින්දෙනුත් ඇහැරී
"කෝ පුතා, කෝ?" කියා පමණි

දිවැසිවර අනාවැකි ගොළු වුණ
සුරදූතයින් තවත් නො ගයන
එක් නිහඬ කළුවර ම හවසක
උන් අරන් ගියා මුළු අහස ම

වමට හිස ඇල කරගෙන
මියෙන පුතුනට දිරිදෙන
සංසාර කපාලය පාමුළ
හිතේ මුළු වැස්ස ම වස්සන

දැවි දැවී යවට වී උණුවෙන
මුළු අහස එකළු කළ තරු රැස
පණ ගැහෙන හදවතක ගැඹුරක
ස්නේහය ම පමණක් ද වරපට

ඉරි තලා ගිය වසත් ළය මත
තබන්නී අවසාන රතු මල
උතුරින් ද දකුණින් ද දිනයෙක
තරු නැගෙන තුරු දෑස නො පියෙන

හමුවුණා නම් ඔබට,
ඈ නමින් මරියා.

## Which Is the dream?

Suns warmth enhances body heat,
underneath the wrappings of head to feet noises,
may nuisance to my dream awaken the soul to the usual theme,
senses do not respond to the call,
of the world to see hear and feel ,
numb limbs and dumb voices,
hate the domain of the sun,
send me back to my dream oh someone
let me be with my cheerful friends
enjoy highly and meet happy ends
how can this devil provoke me thus
and depart from others with this noise fun
thrust to the phenomena of unpleasant senses,
I start usual living not being conscious
Among eatings, shoutings and lives
With smiling fellow beings hiding behind sighs
Quenching the desires thirst and hunger
Panting with fatigue anxiety and wonder
Spend the days and look back at life
Returning to bed with my partner wife
Around me the angels with the nice pretty faces share my bed
They are soft roses, mind is free to consume anything
Flying everywhere with bondless wongs
Which is the reality and which is the dream?
Should I bother to know what they mean
Living to the brim of pleasure of moon
I enjoy the present till the shine peeps soon

Gemunu Gamage

## නුඹට

***බෙහෙතකටවත් ඉඩක් නොතබා හදිසි අසනීපයකින් බිරිඳ මියගිය චින්තක මල්ලීට, සිතට ධෛර්යයක් ලබා දීමට.***

ජීවිත  ගමනෙ සැම බාධක    ජයලැබුවා
අඹුදරුවන් සම කළ සතුටින්    ගෙවුවා
නොසිතුව විටෙක හනිකට ඇවිදින්    මරුවා
අප සැම දෙනම මහ සෝ සයුරක    හෙලුවා

මල්ලියෙ නුඹේ සිත තුළ ඇවිලෙන    ගින්න
අපේ හිත තුළත් ඇවිලෙනවා    නිතින
අම්මා නැති අඩුව දරුවට    නොදැනෙන්න
නුඹේ හිතට ලොකු වගකීමක්    ඔන්න

අම්මා නැතිව පිය සෙනෙහස පෙරට    කරන්
අපි නවදෙනෙක් හැදුවා එක මුතුව    ඉඳන්
හිතේ දුකටනෙතු අග දිදුලන    කඳුලින්
ජීවත් වෙන්න  මල්ලියෙ නුඹ,  දිරිය    ගනින්

අසෝකා දේවසුරේන්ද්‍ර
ලෝරියන්ට්* ප්‍රංශය